පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය
12

# අවසාන වාර පරීක්ෂණය - 2019

පාසලේ නම : ........................................................................................

ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ නම/ ඇතුළත්වීමේ අංකය : ..................................................
........................................................................................................

කාලය : පැය 02 යි.

## දේශපාලන විද්‍යාව I

**සැලකිය යුතුයි :**

- **මෙම ප්‍රශ්න පත්‍රය A සහ B යනුවෙන් කොටස් 02 කි. A කොටස බහුවරණ ප්‍රශ්න 30 කින් සහ B කොටස කෙටි ප්‍රශ්න 20 කින් යුක්ත වේ.**
- **සියලුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සැපයිය යුතුය.**
- **එක් පිළිතුරකට ලකුණු දෙක බැගින් මුළු ලකුණු 100 කි.**

### A කොටස

- **අංක 01 සිට 10 දක්වා ඇති ප්‍රශ්නවලට නොගැළපෙන ප්‍රකාශය තෝරන්න.**

01. දේශපාලන විද්‍යාව හැදෑරීම යනු,
(1) දේශපාලනය සහ ඊට සම්බන්ධ පැතිකඩ ඉගෙනීමයි.
(2) දේශපාලනය සහ ඊට සම්බන්ධ පැතිකඩ පිළිබඳව පර්යේෂණය කිරීමයි.
(3) පවතින දේශපාලන න්‍යාය සහ සංකල්ප විචාරයට ලක් කිරීමයි.
(4) පවත්නා දේශපාලන සංකල්ප හා ක්‍රම විචාරයට ලක් කරමින් විකල්ප යෝජනා ඉදිරිපත් කිරීමයි.
(5) පවත්නා දේශපාලනය තුළ ප්‍රායෝගික දේශපාලනයේ නියැලීමයි. (................)

02. දේශපාලනය කිරීම යනු,
(1) ආණ්ඩු බලය ලබාගැනීමට ක්‍රියා කිරීමයි.
(2) රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණ වල යෙදීමයි.
(3) මැතිවරණ වලට සහභාගී වීමයි.
(4) දේශපාලන පක්ෂවලට සම්බන්ධ වීමයි.
(5) ආණ්ඩුවේ කටයුතු විවේචනය කිරීමයි. (................)

03. දේශපාලන අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශය,
(1) මාක්ස්වාදී න්‍යාය හා ප්‍රවේශය සමඟ අනන්‍ය වී තිබීම
(2) ආණ්ඩුවේ ආර්ථික ප්‍රතිපත්ති අධ්‍යයනය කිරීම එහි මුල් කාලීන න්‍යාය පත්‍රය වීම
(3) සමාජ සැකැස්ම මූලික වශයෙන් තල දෙකකින් සමන්විත වී තිබීම
(4) මෙම සංකල්පය මූලික වශයෙන් භාවිත වූයේ 20 වෙනි සියවසේ ඇමරිකානු චින්තකයන් අතර වීම
(5) මෙම චින්තනයේ මූලික කථිකයන් වූයේ ඇඩම්ස්මිත්, ඩේවිඩ් රිකාඩෝ සහ ජෝන් ස්ටුවට් මිල් සහ තෝමස් මැල්තස් වීම (................)

Education NCP - www.edncp.lk

04. දේශපාලන මතවාද මඟින්,
(1) දේශපාලන ක්‍රියාකාරිත්වයට සහ ගමනට මඟ පෙන්වයි.
(2) සමාජයේ විශාල ජන කොටසක් ආකර්ශණය කරගැනීමට සමත් වෙයි.
(3) එකිනෙකට සංගත අදහස් මාලාවකින් සමන්විත වෙයි.
(4) විවිධ දේශපාලන මතිමතාන්තර ආදියෙන් සමන්විත වෙයි.
(5) ලෝක දේශපාලනයට කිසිදු බලපෑමක් සිදු නොකරයි. (................)

05. තුලනාත්මක දේශපාලනය,
(1) 21 වන සියවසෙන් පසු දේශපාලන විද්‍යාවේ නිශ්චිත විෂය ධාරාවක් ලෙස වර්ධනය විය.
(2) හැදෑරීම ආරම්භ වන්නේ ග්‍රීක යුගයෙනි.
(3) මැකියාවෙලි ද තම දේශපාලනය අධ්‍යයනයේ දී භාවිත කළේ ය.
(4) වෙනත් රටවල දේශපාලනය සමඟ සැසඳීමෙන් වඩා හොඳ අවබෝධයක් ලබාගත හැකි ය.
(5) දේශපාලන තේමා පිළිබඳ සාමාන්‍යකරණය කරන ලද කරුණු මඟින් නිගමනවලට එළඹේ. (................)

06. රාජ්‍ය,
(1) දේශපාලන විද්‍යාවේ කේන්ද්‍රීය තේමාව වේ.
(2) රාජ්‍යයේ කාර්යයන් සාම්ප්‍රදායික වශයෙන් ක්ෂේත්‍ර 03 කින් යුක්ත වේ.
(3) මනුෂ්‍ය සංවිධාන අතර ඉහළම සංවිධානය වේ.
(4) සමාජ සාරධර්ම ආරක්ෂා කිරීම එහි මූලික කාර්යය වේ.
(5) දෑසින් දැකිය නොහැකි, ස්පර්ශ කළ නොහැකි එහෙත් සමාජයේ සෑම තැනකම දැකිය හැකි ප්‍රපංචයක් වේ. (................)

07. නූතන භෞමික රාජ්‍ය,
(1) නිශ්චිත දේශ සීමාවකින් යුක්ත වේ.
(2) ජාතික පදනමක් මත සංවිධානය වී තිබේ.
(3) අන් අයට අණ දෙන එහෙත් අන් අයගෙන් අණ නොලබන බලයක් සහිත සංවිධානයකි.
(4) එහි ස්වාධිපති බලය අභ්‍යන්තර සහ බාහිර වශයෙන් කොටස් දෙකකින් යුක්ත වේ.
(5) රාජ්‍යයේ ස්වාධිපත්‍යය ක්‍රියාත්මක කරන සංවිධානය සමාජය ලෙස හැඳින්වේ. (................)

08. යටත් විජිත රාජ්‍ය,
(1) එය ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් විය.
(2) ලංකාවේ යටත් විජිත රාජ්‍ය ක්‍රමයේ විකාශනය 16 වන සියවසේ මුල් භාගයේ සිදු විය.
(3) වැඩවසම් රාජාණ්ඩු හා ගෝත්‍රික රාජ්‍ය වශයෙන් පැවතුනි.
(4) මධ්‍යගත රාජ්‍ය තන්ත්‍රයක් මත සකස් වූවක් විය.
(5) මිලිටරි රාජ්‍යයක් ලෙස වර්ධනය වීම සිදු විය. (................)

09. පුරවැසියා,
(1) පාලනයට සම්බන්ධ වන්නේ ජනතා නියෝජිතයන් මඟිනි.
(2) නගරයේ වසන්නා යන අදහස ගෙන දේ.
(3) රාජ්‍යයේ කාර්යයට සක්‍රීයව සම්බන්ධ වන තැනැත්තා ය.
(4) ග්‍රීක යුගයේ දී රාජ්‍ය පාලන කටයුතුවලට සෘජුවම සම්බන්ධ නොවීය.
(5) රාජ්‍යයේ සුභසාධනය සහ අයිතිවාසිකම් භුක්ති විඳින රාජ්‍යයට අවනතභාවය දක්වන්නෙකි. (................)

Education NCP - www.edncp.lk

10. ස්ත්‍රී වාදය,

(1) රාජ්‍යයට සම්බන්ධ විශේෂ ස්ත්‍රී වාදී න්‍යායක් නොමැත.

(2) "ලිංගිකත්වය යන්න පුමුතිකරණය කොට තිබේ" යන්න මෙහි මූලික අදහසයි.

(3) විවිධ ගුරු කුල දැකිය නොහැකි ය.

(4) ලිබරල්වාදය හා මාක්ස්වාදය අතර දෝලනය වේ.

(5) පුරුෂ මූලික මෙවලමක් ලෙස රාජ්‍ය ක්‍රියාත්මක වන බව මොවුන්ගේ ප්‍රධාන තර්කයයි. (................)

- **අංක 11 සිට 15 දක්වා ප්‍රකාශ අතුරින් නිවැරදි පිළිතුර ඇතුළත් ප්‍රකාශය හෝ නිවැරදි පිළිතුරු කාණ්ඩය ඇතුළත් වරණය තෝරන්න.**

11. රාජ්‍යයේ ස්වාධිපති බලය බෙදී ඇති ආකාරය අනුව ඒකීය ආණ්ඩු ක්‍රමයකට අයත් ලක්ෂණ වන්නේ,

A ස්වාධිපති බලය මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු අතර බෙදී පැවතීම

B ලෝකයේ බොහෝ රාජ්‍ය පාලන සංවිධානය වී ඇත්තේ ඒකීය රාජ්‍ය ලෙස වීම

C සන්ධීය ක්‍රමය හා සැසඳීමේ දී ඒකීය පාලන ක්‍රමය සරල හා කාර්යක්ෂම පාලන ක්‍රමයක් වීම

D ජාතික ව්‍යවස්ථාදායකය ඒක මණ්ඩලවාදය මත පදනම් වීම

E ප්‍රාදේශීය පාලන ඒකක වෙත බලය විමධ්‍යගත කිරීම දැකිය හැකි වීම

(1) ABCD (2) BCDE (3) ABDE

(4) ACDE (5) ABCE (................)

12. සන්ධීය ආණ්ඩු ක්‍රමයක් යනු, මට්ටම් දෙකකින් සමන්විත පාලන ආකෘතියකි. එහි,

A ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව මඟින්ම බලය බෙදා තිබේ.

B ජාතික ව්‍යවස්ථාදායකය මණ්ඩල දෙකකින් යුක්ත වේ.

C ව්‍යවස්ථා විවරණ බලය ශ්‍රේෂ්ඨාධිකරණය සතු වේ.

D විශාල රාජ්‍යයක් සංවර්ධනය කිරීම සඳහා යොදාගත හැකි වඩාත් යෝග්‍ය පාලන ක්‍රමයක් වේ.

E විවිධත්වය තුළ ඒකීයත්වය ආරක්ෂා නොවන පාලන ක්‍රමයක් ලෙස සැලකේ.

(1) ABCD (2) BCDE (3) ABDE

(4) ACDE (5) ABCE (................)

13. විධායක බලය සංවිධානය වීම අනුව ජනාධිපති ආණ්ඩු ක්‍රමයක ලක්ෂණ වන්නේ,

A ජනාධිපතිවරයා වෙනමම මැතිවරණයකින් තේරී පත්වේ.

B විධායකය නාමික හා සත්‍ය වශයෙන් මූලික කොටස් දෙකකින් යුක්ත වේ.

C විධායකය ව්‍යවස්ථාදායකයට වගකීමට බැඳී නොසිටී.

D ව්‍යවස්ථාදායකයේ විශ්වාසය ඇති තෙක් විධායකය රැඳී පවතී.

E විධායකය ඉවත් කළ හැක්කේ දෝෂාභියෝග යෝජනාවක් සම්මත කිරීමෙන් පමණි.

(1) A, B හා C ය. (2) B, C හා D ය. (3) C, D හා E ය.

(4) A, C හා E ය. (5) B, C හා E ය. (................)

Education NCP - www.edncp.lk

14. දේශපාලන මතවාදයක් ලෙස ලිබරල්වාදය,

A 17 වන සියවසේ දී යුරෝපයේ පැවති වැඩවසම් පාලන ක්‍රමයට එරෙහිව ගොඩනැගුණු දේශපාලන මතවාදයකි.

B මෙහි දේශපාලන ඇගවීම වන්නේ රාජ්‍ය නිර්බාධවාදයයි.

C ආර්ථික සමානාත්මතාවයක් ඇති කිරීම මෙහි මූලික අරමුණයි.

D දෙවන ලෝක යුද්ධයෙන් පසු පසුබෑමට ලක්වූ මතවාදයකි.

E ජාතිය පිළිබඳ හැඟීම පදනම් කරගත් මතවාදයකි.

(1) A හා B ය. (2) B හා C ය. (3) C හා D ය.

(4) D හා E ය. (5) A, B හා D ය. (................)

15. සමාජ ප්‍රජාතන්ත්‍රවාදී මතවාදයට අයත් ප්‍රකාශ කාණ්ඩය වන්නේ,

A 1930 දශකයෙන් පසු පැසිස්ට්වාදී මතය සමාජ ප්‍රජාතන්ත්‍රවාදය සමඟ එක් විය.

B මෙය විසිවන සියවසේ ආරම්භ වී වර්තමානයේ දීත් පවත්නා මතවාදයකි.

C මෙම දේශපාලන මතවාදයේ ප්‍රධාන චින්තකයා වන්නේ එඩ්වඩ් බර්න්ස්ටයින් ය.

D මෙම මතවාදය යුරෝපයේ ආරම්භ වන්නේ මාක්ස්වාදයේ ආභාසය ලබමින් ය.

E පැසිස්ට්වාදයේ සහ ධනවාදයේ සම්මිශ්‍රණයක් ලෙස ගොඩ නැගී තිබේ.

(1) A හා B ය. (2) B හා C ය. (3) C හා D ය.

(4) D හා E ය. (5) A, B හා D ය. (................)

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි හෝ ගැළපෙන පිළිතුර තෝරන්න.**

16. නිරාගමිකවාදය,

(1) ආගම සහ දේශපාලනය එකිනෙකට බැඳී පවතියි.

(2) පල්ලිය හා රාජ්‍ය එකිනෙකින් වෙන් කිරීම මෙහි ප්‍රධාන සටන් පාඨයයි.

(3) රාජාණ්ඩු ක්‍රමයට පක්ෂපාතී බලවේග විසින් ගෙන ආ මතවාදයකි.

(4) මෙහි සම්භවය 20 වන සියවසේ දී යුරෝපය තුළින් බිහි විය.

(5) ලිබරල් නිරාගමික වාදීන්ගේ ප්‍රකාශය වන්නේ ආගම අහෝසි නොකළ යුතු බවයි. (................)

17. ගැටුම් හා ගැටුම් සමථනය,

(1) ග්‍රීක යුගයේ සිටම අධ්‍යයන විෂය ධාරාවක් බවට පත් වී තිබේ.

(2) එකිනෙකට පැහෙන අරමුණු ඇති පාර්ශව දෙකක් අතර පවතින සම්බන්ධතාවයකි.

(3) සහයෝගය, සමානාත්මතාවය සහ එකමුතුකම යන මේවා ගැටුම කරා පරිවර්තනය විය හැකි තත්ත්වයන් ය.

(4) ගැටුම සෑම විටම සමාජ ප්‍රගමනයට හේතු විය හැකි ය.

(5) පුද්ගලයන් අතර ගැටුම් හටගන්නේ එකිනෙකා සමඟ ගැටෙන අරමුණු සොයා යන විටදී ය. (................)

18. ගැටුම් වර්ගීකරණය,

(1) ගැටුම් ආකාර 04 කින් වර්ගීකරණය වේ.

(2) රාජ්‍ය අභ්‍යන්තර ගැටුම් නිර්මාණය වීමේ සාධක 04 ක් පවතී.

(3) අන්තර් රාජ්‍ය ගැටුම් ජාතික දේශපාලනය තුළින් පැන නගී.

(4) රාජ්‍ය අභ්‍යන්තර ගැටුම්වලට බොහෝ විට නිමිත්ත වන්නේ පරිපාලන බලයයි.

(5) සාධනීය ගැටුමෙන් අවාසිදායක ප්‍රතිඵල අත්වන බව විශ්වාස කරයි. (................)

Education NCP - www.edncp.lk

19. ගැටුම් සමථන ක්‍රියාවලියේ දී,

(1) එය සාමාන්‍යයෙන් කෙටිකාලීන ක්‍රියාවලියකි.
(2) ගැටුම් වැළැක්වීම ආකාර 03 කින් යුක්ත වේ.
(3) කල් තබා අනතුරු ඇඟවීම ගැටුම් වැළැක්වීමේ ආරම්භක පියවරකි.
(4) ගැටුමක් සම්පූර්ණයෙන්ම විසඳිය හැකි ක්‍රියාවලියකි.
(5) ගැටුම් පරිවර්තනයෙන් සිදුවන්නේ සාම ගිවිසුමකින් හෝ එක් පාර්ශවයක් ජය ලැබීමෙන් පමණී. (................)

20. සාමය ගොඩනැගීම,

(1) ප්‍රචණ්ඩත්වය සහ යුද්ධය නොමැති වීමෙන් ඇතිවන සාමය නිශේධනීය සාමයයි.
(2) ප්‍රචණ්ඩත්වය සහ යුද්ධය නොමැති වීමෙන් ඇතිවන සාමය සාධනීය සාමයයි.
(3) ධරණීය සාම සංකල්පය මහාචාර්ය ජෝන් පෝල් ලෙඩරාක් විසින් ඉදිරිපත් කර ඇත.
(4) සාමය ගොඩනැගීමේ පදනම වන්නේ ප්‍රජාව අතර අන්‍යෝන්‍ය අවිශ්වාසය ගොඩනැගීම තුළිනි.
(5) සාමය ගොඩනැගීම සඳහා ප්‍රතිසන්ධානගත වීම මට්ටම් 04 කින් සිදුවේ. (................)

- **අංක 21 සිට 25 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරු ඇතුළත් පිළිතුරු කාණ්ඩය තෝරන්න.**

21. කෝල්බෲක් ප්‍රතිසංස්කරණ නිසා පසුකාලීන ශ්‍රී ලංකාවේ ආර්ථික ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම් කිහිපයක් වන්නේ,

A ශ්‍රම හුවමාරුව වෙනුවට මුදලට ශ්‍රමය අලෙවි කිරීම
B යැපුම් ආර්ථිකය වෙළෙඳපොළ ආර්ථිකයක් බවට පත් වීම
C ආනයන - අපනයන ආර්ථිකයකට පදනම වැටීම
D මධ්‍යම පංතියක් බිහි වීම
E දේශීය කෘෂි කර්මාන්තය බිඳ වැටීම

(1) ABCD (2) BCDE (3) ABDE
(4) ACDE (5) ABCE (................)

22. ඩොනමෝර් ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමට බලපෑ හේතු,

A බලය සහ වගකීම එකිනෙකින් වෙන් කර තැබීම
B බ්‍රිතාන්‍ය අභ්‍යන්තර දේශපාලනයේ සිදු වූ වෙනස්කම්
C 1930 දශකයේ සිදු වූ ලෝක ආර්ථික අර්බුදයේ බලපෑම්
D ආණ්ඩුකරුගේ බලතල සීමා කිරීම
E වාර්ගික නියෝජනය මුළුමනින්ම අහෝසි කිරීම

(1) ABCD (2) BCDE (3) ABDE
(4) ACDE (5) ABCE (................)

Education NCP - www.edncp.lk

23. ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මඟින් ඇති කළ විධායක කාරක සභා ක්‍රමයෙන් සිදු වූ යහපත් ප්‍රතිඵල වන්නේ,

A විදේශ කටයුතු පිළිබඳ වගකීම ලාංකිකයන්ට පැවරීම
B ලාංකිකයන්ට විධායක කටයුතු පිළිබඳ පුහුණුවක් ලැබීම
C අනාගත දේශපාලන නායකයින් බිහි වීම
D ලාංකිකයන්ට පැවරුණු විෂය ක්ෂේත්‍රයන්වල විශාල පිබිදීමක් ඇති වීම
E වගකීම් සහිත ආණ්ඩු ක්‍රමයකට අවශ්‍ය පුහුණුව ලැබීම

(1) ABCD (2) BCDE (3) ABDE
(4) ACDE (5) ABCE (................)

24. සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යෝජනා,

A අග්‍රාණ්ඩුකාර ධූරයක් හඳුන්වා දීම
B ව්‍යවස්ථාදායකය ද්වි මාණ්ඩලික වීම
C මූලික අයිතිවාසිකම් පිළිබඳ පරිච්ඡේදයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හඳුන්වා දීම
D වෙස්මිනිස්ටර් ආකෘතියේ ආණ්ඩු ක්‍රමයක් හඳුන්වා දීම
E රාජ්‍ය සේවය හා අධිකරණ සේවය ස්වාධීන කිරීම

(1) ABCD (2) BCDE (3) ABDE
(4) ACDE (5) ABCE (................)

25. සෝල්බරි ව්‍යවස්ථාදායකය,

A එය පාර්ලිමේන්තුව නමින් හඳුන්වනු ලැබීය.
B මහජන මන්ත්‍රී මණ්ඩලයට අග්‍රාණ්ඩුකරු විසින් සුළු ජාතීන් වෙනුවෙන් මන්ත්‍රීවරු 06 දෙනෙකු පත් කර තිබීම.
C රටේ මුදල් පාලනය පිළිබඳ වගකීම සෙනට් මණ්ඩලයට පැවරීම.
D මහජන මන්ත්‍රී මණ්ඩලයේ නිල කාලය වසර 05 කට සීමා වීම.
E 29 (II) වගන්තියට යටත්ව නීති සම්පාදන බලය සීමා වීම.

(1) ABCD (2) BCDE (3) ABDE
(4) ACDE (5) ABCE (................)

- **අංක 26 සිට 30 දක්වා ඇති ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ 02 බැගින් දී ඇත. ඒ එක් එක් ප්‍රශ්න අංකයට අදාළව දී ඇති යෙදුම් යුගලය සම්බන්ධයෙන් පහත 01 වගුව සඳහා වන යොමුවෙහි සඳහන් 01, 02, 03, 04 සහ 05 යන වරණවලින් සුදුසු වරණය තෝරා, එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉරමත ලියන්න.**

I වගුව සඳහා යොමුව

| අංකය | ප්‍රකාශය I | ප්‍රකාශය II |
|---|---|---|
| 1 | සත්‍යය | සත්‍යය |
| 2 | සත්‍යය | අසත්‍යය |
| 3 | අසත්‍යය | සත්‍යය |
| 4 | අසත්‍යය | අසත්‍යය |
| 5 | සත්‍යය | සත්‍ය වන අතර පළමු ප්‍රකාශය තවදුරටත් පැහැදිලි කරයි. |

Education NCP - www.edncp.lk

I වගුව

| | ප්‍රකාශය I | ප්‍රකාශය II | |
|---|---|---|---|
| 26. | 1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණය මගින් ව්‍යවස්ථාදායක සභාවක් හා විධායක සභාවක් හඳුන්වා දීම තුළ විශාල දේශපාලන පරිවර්තනයක් සිදු විය. | කෝල්බෲක් ප්‍රතිසංස්කරණ මගින් පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයට අවශ්‍ය පසුබිම සකස් කරනු ලැබීය. | (................) |
| 27. | කෲව් - මැකලම් ප්‍රතිසංස්කරණය මගින් ප්‍රථම වරට සීමිත ඡන්ද බලය හඳුන්වා දෙන ලදී. | ව්‍යවස්ථාදායක සභා මැතිවරණයේ දී සර් මාර්කස් ප්‍රනාන්දු මහතා උගත් ලාංකික මන්ත්‍රීවරයා ලෙස තේරී පත් විය. | (................) |
| 28. | ඩොනමෝර් ප්‍රතිසංස්කරණය මගින් සර්වජන ඡන්ද බලය හඳුන්වා දීම නිසා ජනතාවගේ දේශපාලන සහභාගිත්වය ඉහළ ගියේ ය. | සර්වජන ඡන්ද බලය පදනම් කරගෙන රාජ්‍ය මන්ත්‍රණ සභාවට මන්ත්‍රීවරු 50 තේරී පත් විය. | (................) |
| 29. | විධායක කාරක සභා ක්‍රමය මගින් ක්ෂේත්‍ර 10 කට අයත් කටයුතු පිළිබඳ වගකීම ලාංකිකයන්ට පැවරිණි. | ආණ්ඩුකාරවරයා සහ විධායක කාරක සභාවල සභාපතිවරුන්ගෙන් අමාත්‍ය මණ්ඩලය සමන්විත විය. | (................) |
| 30. | 1947 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් මෙරටට ජනාධිපති ආණ්ඩුක්‍රමයක් හඳුන්වා දෙන ලදී. | සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරරණය යටතේ මෙරට ඉහළම අධිකරණය වූයේ බ්‍රිතාන්‍ය ප්‍රිවි කවුන්සිලයයි. | (................) |

Education NCP - www.edncp.lk

## B කොටස

31. දේශපාලන ශික්ෂණය ශාස්ත්‍රීය ලෙස හැදෑරීමේ දී වැදගත් තේමා දෙකක් තිබේ. එම දෙක නම් කරන්න.

1. ..............................

2. ..............................

32. තුළනාත්මක අධ්‍යයන ප්‍රවේශයේ ධාරා තුනක් පවතී. ඉන් දෙකක් දක්වන්න.

1. ..............................

2. ..............................

33. යුරෝපයේ සහ ඇමරිකාවේ දේශපාලන පක්ෂ වර්ධනය වන්නේ, ප්‍රධාන සාධක දෙකක් පසුබිම් කරගෙනය. එම සාධක දෙක දක්වන්න.

1. ..............................

2. ..............................

34. 1. "ආණ්ඩුව දක්වන හිතුවක්කාරි ක්‍රියාවන්ට සංවරණයක් ලෙස කටයුතු කරයි"

2. "රාජ්‍යයෙන් පරිබාහිරව සහ ස්වාධීනව පුරවැසියන් විසින් පොදු අරමුණු වෙනුවෙන් කටයුතු කිරීමට සංවිධානය වී තිබේ"

මෙම ප්‍රකාශ දෙක අදාළ සමාජ කණ්ඩායම් හඳුන්වන පොදු නාම දෙක පිළිවෙලින් දක්වන්න.

1. ..............................

2. ..............................

35. "රාජ්‍ය ඉහළම සමාජ සංවිධානය වන්නේ ය" යන්නට ඇති අර්ථකථන දෙක දක්වන්න.

1. ..............................

2. ..............................

36. නියෝජිත ආණ්ඩුක්‍රමය ක්‍රියාත්මක වීමට අවශ්‍ය මූලික සමාජ, දේශපාලන විචල්‍යයන් ගණනාවක් ඇත. ඉන් 02 ක් ලියන්න.

1. ..............................

2. ..............................

37. සමාජ සම්මුතිවාදීන් පළකළ අදහස් අනුව රාජ්‍ය බිහිවීමට පෙර හා පසු පැවති සමාජ තත්ත්වයන් (ක්‍රමයන්) දෙකක් දක්වන්න.

1. ..............................

2. ..............................

Education NCP - www.edncp.lk

38. සන්ධීය ආණ්ඩුක්‍රමයක සාපේක්ෂ වශයෙන් ස්වායත්ත ආණ්ඩු වර්ග දෙකක් දක්නට ලැබේ. එම දෙක නම් කරන්න.

1. ..............................................................................................................................

2. ..............................................................................................................................

39. පහත වගන්ති මගින් කියැවෙන ආණ්ඩුක්‍රම හඳුනාගෙන පිළිවෙලින් නම් කරන්න.

1. මෙම ආණ්ඩුක්‍රමයේ අතිමූලික ගති ලක්ෂණය නම්, ව්‍යවස්ථාදායකය හා විධායකය වෙන වෙනම තේරී පත් වීමයි.
2. මෙම ආණ්ඩුක්‍රමයේ දී පාලකයන්ගේ තීරණ බාහිර නෛතික අවරෝධක හෝ ජනතා පාලනය හෝ යන දෙකෙන් එකකටවත් ලක් නොවේ.

1. ..............................................................................................................................

2. ..............................................................................................................................

40. පහත වගන්ති වලින් කියවෙන දේශපාලන මතවාදයන් ඉදිරිපත් කළ චින්තකයින් දෙදෙනා පිළිවෙලින් නම් කරන්න.

1. "රාජ්‍ය බලයේ මූලාශ්‍රය මහජනතාවයි"
2. "ආණ්ඩුවේ බලය ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ වශයෙන් බෙදා තිබිය යුතුය"

1. ..............................................................................................................................

2. ..............................................................................................................................

41. සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්ට අනුව ධනවාදය, සමාජවාදී මූලධර්ම අනුව ප්‍රතිසංස්කරණය කිරීමේ ප්‍රතිපත්තීන් දෙකක් දක්වන්න.

1. ..............................................................................................................................

2. ..............................................................................................................................

42. ගැටුම්වල කාර්යයන් විමසීමේ දී ප්‍රධාන ප්‍රවේශ දෙකකි. එම දෙක දක්වන්න.

1. ..............................................................................................................................

2. ..............................................................................................................................

43. රාජ්‍ය අභ්‍යන්තර ගැටුම් නිර්මාණය වීමේ සාධක කීපයක් ඇත. ඉන් දෙකක් දක්වන්න.

1. ..............................................................................................................................

2. ..............................................................................................................................

44. ගැටුම් සමථන ක්‍රියාවලියේ දී ප්‍රයෝජනයට ගන්නා මූලික මාධ්‍ය 04 ක් පවතී. ඉන් දෙකක් දක්වන්න.

1. ..............................................................................................................................

2. ..............................................................................................................................

Education NCP - www.edncp.lk

45. 1833 හඳුන්වා දුන් කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ වලදී විලියම් කෝල්බෲක් හා චාල්ස් හේ. කැමරන් අවධානය යොමු කළ ක්ෂේත්‍ර දෙක පිළිවෙලින් ලියන්න.

1. විලියම් කෝල්බෲක්
2. චාල්ස් හේ. කැමරන්

1. ..............................................................................................................................

2. ..............................................................................................................................

46. බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන මුල් සමයේ අහෝසි කළ ද්විත්ව පාලනයේ පාලන ක්‍රම දෙක ලියන්න.

1. ..............................................................................................................................

2. ..............................................................................................................................

47. 1931 හඳුන්වා දුන් ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ රාජ්‍ය මන්ත්‍රණ සභාවේ නියෝජිතයින් වර්ග තුනකින් යුක්ත වේ. ඉන් දෙකක් දක්වන්න.

1. ..............................................................................................................................

2. ..............................................................................................................................

48. 1947 සෝල්බරි ආණ්ඩු ක්‍රමයේ ව්‍යවස්ථාදායකය හා 1972 පළමු ජනරජ ආණ්ඩු ක්‍රමයේ ව්‍යවස්ථාදායකය හැඳින්වූ නිල නාම දෙක දක්වන්න.

1. 1947 - ..............................................................................................................

2. 1972 - ..............................................................................................................

49. 1947 සෝල්බරි ආණ්ඩු ක්‍රමයේ ව්‍යවස්ථාදායකය ද්වි මාණ්ඩලික විය. එම මණ්ඩල දෙක ලියන්න.

1. ..............................................................................................................................

2. ..............................................................................................................................

50. 1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයේ හා 1972 පළමු ජනරජ ආණ්ඩු ක්‍රමයේ පැවති නාමික විධායකය හැඳින්වූ නිල නාමයන් ලියන්න.

1. 1947 - ..............................................................................................................

2. 1972 - ..............................................................................................................

***

Education NCP - www.edncp.lk

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය
12

# දෙවන වාර පරීක්ෂණය - 2017

විෂයය - දේශපාලන විද්‍යාව II

පාසලේ නම : ......................................................................................................

ශිෂ්‍යයා / ශිෂ්‍යාවගේ නම / ඇතුළත්වීමේ අංකය : ..................................................
......................................................................................................................

කාලය : පැය 03 යි.

**සැලකිය යුතුයි :**

- **මෙම ප්‍රශ්න පත්‍රයේ A , B , C වශයෙන් කොටස් තුනකින් යුක්තය.**
- **A කොටස තුළ කෙටි ප්‍රශ්න 20 ක් අන්තර්ගතවේ. සම්පූර්ණ පිළිතුරු සඳහා ලකුණු 01ක්ද , අර්ධ පිළිතුරක් සඳහා ලකුණු $\frac{1}{2}$ ක් ද හිමිවේ. මෙම කොටසේ සියලුම ප්‍රශ්න වලට කෙටි පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සපයා B හා C කොටස්වල පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.**
- **B හා C කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**

## A කොටස

01. I. "පාලකයා දාර්ශනිකයෙකු විය යුතු අතර , දාර්ශනිකයා පාලකයෙකු විය යුතුය."
 II. "මිනිසා උපතින්ම දේශපාලන සත්වයෙකි."
 ඉහත ප්‍රකාශ දෙක කළ දාර්ශනිකයන් දෙදෙනා පිළිවෙළින් නම් කරන්න.
 I. ..........................................................................
 II. ..........................................................................

02. I. රෝම යුගයේ හා
 II. මධ්‍යතන යුගයේ දේශපාලන විද්‍යා විෂය වර්ධනයට අදහස් පලකළ දාර්ශනිකයින් දෙදෙනෙකු පිළිවෙළින් නම් කරන්න.
 I. ..........................................................................
 II. ..........................................................................

03. I. ප්‍රායෝගික තත්වයන් මත නොව මනඃ කල්පිතයන් මත ගොඩනැගුණු අධ්‍යයන ක්‍රමයකි.
 I. සැබෑ තත්වයන් පමණක් අධ්‍යයනයට ලක්කරන ක්‍රමයකි.
 ඉහත ප්‍රකාශ වලින් කියැවෙන අධ්‍යයන ක්‍රම දෙක පිළිවෙළින් දක්වන්න.
 I. ..........................................................................
 II. ..........................................................................

04. I. යම් දේශපාලන ඒකකයක් රාජ්‍යයක් ලෙස පිළිගැනීමටත් ,
 II. ජාතික රාජ්‍යයට නෛතික පදනමක් සැපයූ , සම්මුතීන් දෙක පිළිවෙළින් දක්වන්න.
 I. ..........................................................................
 II. ..........................................................................

Education NCP - www.edncp.lk

05. I. අසහාය බලැති රාජාණ්ඩු ක්‍රමය ,

II. පාර්ලිමේන්තු ස්වාධිපත්‍ය සහිත පාලන ක්‍රමය , සමාජ සම්මුතිවාදයට අනුව ඉහත පාලන ක්‍රම අපේක්ෂා කළ චින්තකයින් දෙදෙනා පිළිවෙළින් නම් කරන්න.

I. ..........................................................................

II. ..........................................................................

06. පහත ප්‍රකාශ අතරින් පෙන්නුම්කරන දේශපාලන සංවිධාන දෙක පිළිවෙළින් නම් කරන්න.

I. මෙම දේශපාලන සංවිධානය අසහාය බලයක් භුක්ති විඳී.

II. මෙම දේශපාලන සංවිධානය මිනිස් සමාජයක කාර්යය මෙහෙයවීමේ අධිකාරී බලය සහිත ආයතනයකි.

I. ..........................................................................

II. ..........................................................................

07. I. විශාල වශයෙන් ඡන්ද අපතේයන ක්‍රමයක් ලෙස පොදු පිළිගැනීමය.

II. මහජනයා හා නියෝජිතයා අතර දුරස් සම්බන්ධයක් පවතී යන මතය පවතින ක්‍රමයකි.

ඉහත ප්‍රකාශ අතරින් අර්ථ නිරූපණය වන නියෝජන ක්‍රම දෙක පිළිවෙළින් ලියන්න.

I. ..........................................................................

II. ..........................................................................

08. I. "මෙයින් අදහස් කරන්නේ දේශපාලන ක්‍රමය තුළ ජීවත්වන ජනතාව විසින් එම දේශපාලන ක්‍රමය කෙරෙහි ගොඩනැගී තිබෙන ගතිගුණ , විශ්වාසයන් , අගය කිරීම් යනාදී සමස්ථයෙනි."

II. මෙයින් අදහස් කරන්නේ සමස්ථ පුද්ගලයින් , එහි බල ආයතන සමග ක්‍රියාකාරී වෙමින් බල ආයතන වටා හැසිරෙන ආකාරය පිළිබඳවයි.

ඉහත අදහස් අනුව කුමන (දේශපාලන ක්‍රියාදාමයන්ට) ප්‍රපංචයන් තුළට ගොනු කළ හැකිදැයි පිළිවෙලින් දක්වන්න.

I. ..........................................................................

II. ..........................................................................

09. I. ආචාර විද්‍යාත්මක සංකල්පය පදනම් කොටගෙන ගොඩනගා ඇත.

II. පොදු සමාජ යහපත සඳහා පුරවැසියන් විසින් ඉටුකළ යුතු බවට රාජ්‍යයේ නීති මගින් විධානය කොට ඇති කාර්යයන් ගොඩනගා ඇත.

ඉහත ප්‍රකාශ ඇසුරෙන් ඒවා කුමන යුතුකම් වර්ගයට අයත්දැයි පිළිවෙළින් දක්වන්න.

I. ..........................................................................

II. ..........................................................................

10. I. "ඔබ කොතරම් උස මිනිසෙකු වුවත් නීතිය තිබෙන්නේ ඔබට ඉහළින්ය."

II. සියලුම සතුන් අතරින් උසස් ම සතා මිනිසා වේ. නමුත් නීතියෙන් සහ යුක්තියෙන් ඔහු වෙන් කළ විට සියලුම සතුන් අතරින් නරක ම සතා මිනිසා වේ."

ඉහත ප්‍රකාශ කළ පුද්ගලයන් දෙදෙනා පිළිවෙළින් නම් කරන්න.

I. ..........................................................................

II. ..........................................................................

Education NCP - www.edncp.lk

11. 1970 අවසන් කාලයේ දී ආර්ථික කටයුතු හා පරිපාලන කටයුතු මෙහෙයවීම ද්විත්ව පාලනය ලෙස හැඳින්වේ. එසේ පාලනය කළ ආයතන දෙක පිළිවෙළින් නම් කරන්න.

I. ..........................................................................

II. ..........................................................................

12. 1833 කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ මඟින් හඳුන්වාදුන් ව්‍යවස්ථාදායක සභාවේ
I. නිල ලත් ,
II. නිල නොලත් , සංඛ්‍යාව පිළිවෙළින් දක්වන්න.

I. ..........................................................................

II. ..........................................................................

13. ආගමික පුනර්ජීවන ව්‍යාපාරයට ,
නායකත්වය සැපයූ හින්දු හා ඉස්ලාම් නායකයින් දෙදෙනෙකු නම් කරන්න.

I. ..........................................................................

II. ..........................................................................

14. 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණය මගින් 10 දෙනෙකුගෙන් යුත් අමාත්‍ය මණ්ඩලයක් ස්ථාපිත කළ අතර එය සමන්විත වූයේ වර්ග දෙකකිනි. එම වර්ග දෙක දක්වන්න.

I. ..........................................................................

II. ..........................................................................

15. I. 1931 ඩොනමෝර් අණ්ඩුක්‍රමයේ හා
II. 1947 සෝල්බරි ආණ්ඩුක්‍රමය අනුව බ්‍රිතාන්‍ය රැජින නියෝජනය කළ ප්‍රධාන විධායකයා හැඳින්වූ නිල නම් දෙක පිළිවෙලින් දක්වන්න.

I. ..........................................................................

II. ..........................................................................

16. 1947 සෝල්බරි ආණ්ඩු ක්‍රමයෙන් හඳුන්වාදුන් සීමානිර්ණය කොමිෂන් සභාව ඡන්ද කොට්ඨාස බෙදීම පදනම් කරගත් සාධක දෙක දක්වන්න.

I. ..........................................................................

II. ..........................................................................

17. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා යටතේ රාජ්‍ය සේවය ස්වාධීන කිරීමේ අරමුණින් පිහිටවූ ආයතන දෙක දක්වන්න.

I. ..........................................................................

II. ..........................................................................

18. ඍජු මහජන ඡන්දයෙන් හා නාමකරණයෙන් , 1978 ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තුවට තෝරාගත් නියෝජිතයන් සංඛ්‍යාව පිළිවෙළින් දක්වන්න.

I. ..........................................................................

II. ..........................................................................

Education NCP - www.edncp.lk

19. I. 1978 ව්‍යවස්ථාව අනුව 19 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් පසු ජනාධිපතිවරයකුගේ නිල කාලය හා
II. පාර්ලිමේන්තුවට පත් වී විසිරුවාහැරිය හැකි කාලය පිළිවෙළින් දක්වන්න.

I. ..........................................................................

II. ..........................................................................

20. 1978 විධායක ජනාධිපතිවරයාට එරෙහිව දෝෂාභියෝග යෝජනාවක් ගෙන ආ හැකි චෝදනා දෙකක් දක්වන්න.

I. ..........................................................................

II. ..........................................................................

Education NCP - www.edncp.lk

## B කොටස

01) පහත දක්වෙන ඒවායින් දෙකක් විභාග කරන්න.

I. දේශපාලන විද්‍යාව හා අනෙකුත් සමාජීය විද්‍යා විෂයයන් අතර ඇති සම්බන්ධතාවය.

II. දේශපාලන විද්‍යාවේ ගතිකත්වය.

III. දේශපාලන විද්‍යාව හැදෑරීමේ වැදගත්කම.

IV. දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය.

02) පහත දක්වෙන ඒවායින් දෙකක් සාකච්ඡා කරන්න.

I. ජාතික රාජ්‍ය ක්‍රමය

II. සුබ සාධක රාජ්‍ය ක්‍රමය

III. රාජ්‍ය හා සමාජය

IV. රාජ්‍ය හා ආණ්ඩුව

03) පහත දක්වෙන ඕනෑම දෙකක් සාකච්ඡා කරන්න.

I. ආණ්ඩුවේ කාර්යභාරය

II. ආණ්ඩුවේ බලය සංවරණය කිරීමේ මාර්ග

III. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක ලක්ෂණ

IV. ෆෙඩරල්වාදයේ යහපත් , අයහපත් ලක්ෂණ

04) ප්‍රජාතන්ත්‍රවාදී අණ්ඩුකරණය තුළ පහත දැක්වෙන ඒවායින් දෙකක කාර්යභාරය සාකච්ඡා කරන්න.

I. දේශපාලන පක්ෂ

II. බලපෑම් කණ්ඩායම්

III. සිවිල් සමාජය

IV. ජන මාධ්‍ය

Education NCP - www.edncp.lk

## C කොටස

05. ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලන සමයේ සිදුවූ වෙනස්කම් ඇසුරෙන් පහත සඳහන් ඒවායින් දෙකක් සාකච්ඡා කරන්න.

I. දේශපාලන ප්‍රතිඵල
II. ආර්ථික ප්‍රතිඵල
III. සමාජ ප්‍රතිඵල
IV. අධිකරණ වෙනස්කම්

06. ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය ඇසුරෙන් පහත මාතෘකා වලින් දෙකක් සාකච්ඡා කරන්න.

I. ප්‍රතිසංස්කරණයට බලපෑ හේතු.
II. සර්වජන ඡන්ද බලය ලැබීම.
III. වාර්ගික නියෝජනය අහෝසි කිරීම.
IV. ආණ්ඩුක්‍රමයේ යහපත් ලක්ෂණ.

07. ශ්‍රී ලංකාවේ යටත් විජිත යුගයේ ක්‍රියාත්මක වූ සමාජ ව්‍යාපාර පහත දැක්වේ. ඉන් දෙකක් සාකච්ඡා කරන්න.

I. ආගමික පුනර්ජීවන ව්‍යාපාරය
II. ජාතික ව්‍යාපාරය
III. කම්කරු ව්‍යාපාරය
IV. වාමාංශික ව්‍යාපාරය

08. පහත දැක්වෙන ඒවායින් දෙකක් විභාග කරන්න.

I. 1948 සෝල්බරි ආණ්ඩුක්‍රමය අනුව ව්‍යවස්ථාදායකයේ තත්වය ,
II. 1948 සෝල්බරි ආණ්ඩුක්‍රමය අනුව සුළු ජන රැකවරණය සඳහා යෙදූ විධිවිධාන ,
III. 1972 ජාතික රාජ්‍ය සභාවේ තත්වය ,
IV. 1978 ආණ්ඩුක්‍රමය අනුව ජනාධිපතිවරයා තෝරා පත්කරගන්නා ආකාරය ,

Education NCP - www.edncp.lk